දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832
ලේකම් / செயலாளர் / Secretary } 2784811
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50
**Fax**: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk
ඔබේ අංකය / உமது இல. / Your No. } ………………………………

**අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி அமைச்சு
**Ministry of Education**
'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ED/01/26/01/14/01

දිනය / திகதி / Date } 2011-06-21

**චක්‍රලේඛ අංක - 2011/20**

පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය ස්ථාපිත කිරීම

රජයේ ඉ - රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ සියලු ම ආයතන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් සවිබල ගැන්වුණු ආයතන බවට අත්‍යවශ්‍යයෙන් පත් කළ යුතු වේ. මෙහි දී සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන විෂය ක්‍රියාත්මක කරනු ලබන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා කලාප අධ්‍යාපන කාර්යාල, වඩාත් ඉදිරි දැක්මකින් යුතු ව ශ්‍රී ලංකාව දැනුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ අරමුණින් කටයුතු කළ යුතු අතර ඒ සඳහා සුදුසු වැඩපිළිවෙලක් පළාත හා කලාප තුළ මෙන් ම එම කාර්යාල තුළ ද ඇති කළ යුතු වේ.

මෙම කාර්යය මැනවින් ඉෂ්ට කිරීම සඳහා වූ කේන්ද්‍රීය ස්ථානයක් ලෙස "තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකක" සියලු ම පළාත් හා කලාප අධ්‍යාපන කාර්යාලයන් හි භෞතික වශයෙන් ස්ථාපිත කළ යුතු අතර එය ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු යටතේ උචිත සහායක කාර්ය මණ්ඩලයක් සහිතව නොපමාව ස්ථාපිත කළ යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි.

මෙම ඒකකය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන විෂයය මෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කාර්යයන් ඉටුකිරීමේ අරමුණින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා කලාප අධ්‍යාපන කාර්යාලයන් හි ස්ථාපිත කරනු ලබන ස්ථාන බව ද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව 2011 ජූලි 31 දිනට පෙර මෙම ඒකක ස්ථාපිත කර ඒ සඳහා පත් කරන ලද නිලධාරීන්ගේ සහ සහායක නිලධාරීන්ගේ ද විස්තර පිළිබඳ ව අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව ඇතුලු ව අදාළ ආයතන දැනුවත් කළ යුතු වේ.

එච්.එම්.ගුණසේකර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය
2. අධ්‍යක්ෂ, රාජ්‍ය අංශ ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
3. අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) , අධ්‍යාපන අමාත්‍යාංශය
4. අධ්‍යාපන අධ්‍යක්ෂ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, අධ්‍යාපන අමාත්‍යාංශය